සැ. යු. - 2023.10.13 දින පළකරන ලද අංක 2354 *ගැසට් පත්‍රයේ* III සහ IV(අ) කොටස් පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,355 - 2023 ඔක්තෝබර් මස 20 වැනි සිකුරාදා - 2023.10.20**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... ... | 580 |
| බුද්දල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 584 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2023 නොවැම්බර් මස 10 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2023 ඔක්තෝබර් මස 27 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**206 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2023 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පිස්කල් විකිණීම්

## ඇල්පිටිය දිසා අධිකරණයේ දී ය

### පිස්කල් වෙන්දේසියේ විකිණීමයි

නිලූකා දිල්රුක්ෂි ගෝනපීනුවලගේ,
''දිල්රුක්'', තල්ගස්පේ.

*නඩු අංකය :* M/323.

.....................*පැමිණිලිකාරිය.*

*එදිරිව*

කැල්ලපත විතානගේ විජේතුංග,
කිරිදොල පාර, තල්ගස්පේ.

............................*විත්තිකරු.*

ඉහත සඳහන් නඩුවේ වර්ෂ 2011 ක් වූ මාර්තු මස 29 වැනි දිනැති ඇල්පිටිය දිසා අධිකරණයේ නඩු තීන්දුව ප්‍රකාර විත්තිකරුගෙන් පැමිණිලිකාරියට අයවිය යුතු රුපියල් 400,000/- ක මුදලක් ද, එකී මුදල මත වර්ෂ 2004.09.14 දින සිට තීන්දු ප්‍රකාශිත දින දක්වා නෛතික පොළිය සහ තීන්දු ප්‍රකාශයේ දින සිට සම්පූර්ණ මුදල ගෙවා නිමවන තෙක් නෛතික පොළිය ද සහ නඩු ගාස්තු ද පැමිණිලිකාරියට අයකර ගැනීම සඳහා විත්තිකරුට විරුද්ධව ප්‍රකාශ කරන ලද නඩු තීන්දුව ප්‍රකාර ක්‍රියා කිරීමට විත්තිකරු අපොහොසත් වී ඇති බැවින්, එකී මුදල් විත්තිකරුගෙන් පැමිණිලිකාරියට අයකර ගැනීම සඳහා මෙම නඩුවෙන් මා වෙත නිකුත් කර ඇති ඇස්කීසි ආඥාවේ බලය පිට පිස්කල් තහනමට ගෙන ඇති මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති විත්තිකරුට අයත් නිශ්චල දේපළ **වර්ෂ 2023ක් වූ නොවැම්බර් මස 29 වැනි දින පෙ. ව. 11.30ට** එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

*දේපළට පිවිසීම.-* ඇල්පිටිය පිටිගල පාරේ, තල්ගස්පෙ පාසල දක්වා පැමිණ එතැනින් දකුණට හැරී කිරිදොල පාරේ කි. මී. 1/2ක් පමණ යන විට කිරිදොල පාරට මීටර් 50ක් පමණ ඇතුලට වන්නට පාරේ වම් පැත්තේ අදාළ දේපළ පිහිටා ඇත. (කිරිදොල පාරේ සිට දේපළට පිවිසුම් මාර්ගයක් ඇත.)

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසන් වූ වහාම ගැනුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු ය. චෙක්පත් භාරගනු නොලැබේ.

1. ගැණුම්කරු විසින් විකුණුම් මිලෙන් 25%ක් දේපළ මිල දී ගත් වහාම ගෙවිය යුතු වන අතර, ඉතිරි 75%ක මුදල වෙන්දේසි දින සිට දින 30ක් ඇතුලත නඩුවේ බැරට තැන්පත් කළ යුතු ය.

2. සිවිල් නඩු විධාන සංග්‍රහයේ 258 වගන්තිය අනුව ගැණුම්කරු විසින් ගැණුම් මිලෙන් පළමු රු. 7,500/- සඳහා රු. 150/-ක ගාස්තුවක් ද, රු. 7,500/- ඉක්මවන සෑම රු. 1,000/-ක් සඳහාම රු. 5/- බැගින් ද පිස්කල් ගාස්තු ගෙවිය යුතු ය.

### උපලේඛනය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, බෙන්තොට වළල්ලාවිටි කෝරලයේ, ඇල්පිටිය ලේකම් කොට්ඨාශයට අයත් ඇල්පිටිය ප්‍රාදේශීය සභා සීමාව තුළ අංක 31 බී දරන ග්‍රාම සේවා වසමේ තලගස්පේ පිහිටි බී. එස්. පී. පී. 588 සහ සර්වේයර් ජනරාල්තුමාගේ අංක 430033 හා 1934.03.27 දින දරන පිඹුරේ සඳහන් ''කිරිමැටියහේන කැලේ *හෙවත්* පුස්හේන'' නම් වූ උතුරට : ටී. පී. 297929 දරන ඉඩම ද, නැගෙනහිරට : පුස් හේන දොලට අත්හරින ලද ඉඩම ද, දකුණට : ලොට් අංක 197 දරන ඉඩම ද සහ බස්නාහිරට : ලොට් 197 කිව් දරන ඉඩම ද යන මායිම් තුල අක්කර දෙකකුත් පර්චස් හතරක් (අක්. 2, පර්. 04) ක් විශාල ඉඩම සහ එහි තුළ තිබෙන තේ වගාව හා අනිකුත් ගහකොල, පළතුරු ආදී සියළු දේත් වේ.

අධිකරණයේ අණ පරිදි,

රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
සාම විනිසුරු,
දිසා අධිකරණය - ඇල්පිටිය.

2023 සැප්තැම්බර් මස 15 වැනි දින දී ය.

10-278

**කොළඹ දිසා අධිකරණයේ දී ය**

පිස්කල් මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

එලායන්ස් ෆිනෑන්ස් කම්පැණි පී.එල්.සී.,
අංක 84, වෝඩ් පෙදෙස, කොළඹ 07.

.......................*පැමිණිලිකරු.*

*නඩු අංකය* : DMB/181/22.
*ඇස්කිසි අංකය* : 54/23 වැලිසර/දිසා/අධි
*ස්වභාවය* : උකස්
*වටිනාකම* : රු. 5,832,495.57

*එදිරිව*

01. පී. එම්. ෆැබ්රික් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්,
අංක 55, ජේ/1, තිඹිරිගස්යාය, හැඳල, වත්තල.

*සහ*

අංක 46/2/1, හැඳල පාර, හැඳල, වත්තල.

02. විදානලාගේ ලසන්ත ඩියන් ද මෙල්,
අංක 57/3, නිමල මරියා මාවත,
හැඳල, වත්තල.

*ඔහුගේ ඇටෝර්නි බලකරු වන,*

විදානලාගේ තිවංක ශනේෂ් ද මෙල්,
අංක 57/3, නිමල මරියා මාවත, හැඳල, වත්තල.

.....................*විත්තිකරුවන්.*

කොළඹ දිසා අධිකරණයේ ඉහත අංක දරන නඩුවේ 2023.02.27 වැනි දින ඇතුලත් කරන ලද සමථය පරිදි විත්තිකරුවන් විසින් එකී සමථය කඩ කර ඇති බැවින්, සමථ තීන්දු ප්‍රකාශය පරිදි,

*(අ)* වර්ෂ 2020.08.26 දිනට රුපියල් පනස්අට ලක්ෂ තිස් දෙදහස් හාරසිය අනූ පහයි ශත පනස්හතක (රු. 5,832,495.57) මුදල සහ ඒ මත වර්ෂ 2020.08.27 දින සිට එකී මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම වෙන තුරු ඒ මත මාසික පොළිය ද සහ ව්‍යවස්ථාපිත ගාස්තු ද සමඟ අය කර දෙන ලෙසත්,

*(ආ)* මෙහි පහත උපලේඛනයෙහි විස්තර කරන සියලුම දේපළ හා ඊට අයත් සියලුම ගොඩනැගිලි, සවිකිරීම්, මාර්ග අයිතිවාසිකම් සහ එකී ඉඩමට හා පරිශ්‍රයට අයත් සියලුම අනුබද්ධ සහ එකී ඉඩම සහ අනුබද්ධ සහ එකී ඉඩම සහ පරිශ්‍රය මතින් හෝ තුළින් විත්තිකරුවන්ට සියලුම අනුබද්ධ සහ එකී ඉඩම සහ පරිශ්‍රය මතින් හෝ තුළින් විත්තිකරුවන්ට ඇති කවරාකාරයක හෝ ඉල්ලීම් සියල්ල, ඉහත කී ණය ආපසු අයකර ගැනීම සඳහා බැඳෙන බවට සහ ක්‍රියාත්මක කළ හැකි බවට ප්‍රකාශ කරන ලෙසත්,

*(ඇ)* තීන්දු ප්‍රකාශිත ඉහත කී මුදල්, පොළී, නඩු ගාස්තු සහ ව්‍යවස්ථාපිත ගාස්තු ද, සමඟ තීන්දු ප්‍රකාශ දිනයේ සිට මාස දෙකක් ඇතුළත ගෙවීම පැහැර හැරියහොත්, රජයේ *ගැසට් පත්‍රයේ* සහ අවම වශයෙන් දේශීය පුවත්පත් දෙකක නිසි පරිදි ප්‍රසිද්ධ කිරීමෙන් අනතුරුව අධිකරණය විසින් පත්කරනු ඇති වෙන්දේසිකරුවෙකු මාර්ගයෙන්, මෙහි පහත උපලේඛනයේ විස්තර කෙරෙන ඉඩම ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන ලෙසත් සහ එම ප්‍රසිද්ධ කිරීම මගින් පෑ4 වශයෙන් ලකුණු කරන ලද බැඳුම්කරයන් මත ප්‍රමාණවත් යැයි වෙන්දේසිකරු විසින් සලකනු ලබන විකුණුම් කොන්දේසි අධිකරණය විසින් අනුමත කරන ලෙසත් සහ පහත සඳහන් දෑ කිරීම සඳහා එකී වෙන්දේසිකරුට නියෝග කරන ලෙසත්,

(i) සංශෝධිත 1949 අංක 06 දරන උකස් පනතේ 52 (01) වගන්තිය යටතේ දක්වා ඇති පරිදි මෙහි පහත උපලේඛනයෙ හි විස්තර කර ඇති එකී ඉඩම හා පරිශ්‍රය පළමුව වර්තමාන වෙළඳපොළේ වටිනාකමට විකිණීම සඳහා තබන ලෙසත් සහ එම අවස්ථාවේ ලංසු තබන්නන් නොමැති නම්, තීන්දු ප්‍රකාශය යටතේ අයවිය යුතු මුදල වශයෙන් දැන්වීමේ නියම කරන ලද මිල කරන ලද වටිනාකමට විකිණීම සඳහා තබන ලෙසත් සහ එම විකිණීමේ දී ලංසු තබන්නන් නොමැති නම් ඉන් අනතුරුව වැඩිම ලංසුවට විකිණීමට තබන ලෙසත්,

(ii) මෙහි උපලේඛනයෙ හි විස්තර කර ඇති උකස් කරන ලද එකී දේපළ සඳහා ලංසු තැබීමට සහ මිල දී ගැනීමට පැමිණිලිකරුට හෝ පැමිණිලිකරු වෙනුවෙන් වෙනත් ඕනෑම අයෙකුට ඉඩ ලබා දෙන ලෙසත් සහ පැමිණිලිකරු ගැණුම්කරු වන අවස්ථාවක දී එහි හිමිකම් පෑමේ සහ පිරිවැයේ ප්‍රමාණයට බැර සැලසීම සඳහා එයට ඉඩ ලබා දෙන ලෙසත්,

(ඈ) එවැන විකිණීමක දී විකිණීමේ කොන්දේසි නිසි ලෙස සපුරා ඇති බවට සහ සෑහීමට පත් වීමෙන් අනතුරුව ගැණුම්කරුගේ වාසියට නිසි පැවරීම් ඔප්පුවක් මගින් අවශ්‍ය පැවරීම් සිදු කිරීමට ද, වෙන්දේසිකරුට හෝ අධිකරණය විසින් බලය පවරන වෙනත් ඕනෑම තැනැත්තෙකුට නියම කරන ලෙසත්, පැමිණිලිකරු ගැනුම්කරු වන අවස්ථාවක දී හිමිකම්පෑමේ සහ පිරිවැයේ ප්‍රමාණයට එය බැර සැලසීමට ඉඩ ලබා දෙන ලෙසත්, ගැණුම්කරු තුන්වන පාර්ශ්වයක් වන අවස්ථාවක දී ගැණුම් මිල අධිකරණයේ තැන්පත් කරන ලෙසත්,

(ඉ) මෙහි උපලේඛනයෙ හි විස්තර කරන ඉඩමෙහි සහ පරිශ්‍රයෙහි හිස් භුක්තිය ගැණුම්කරුවෙකුට භාර දෙන ලෙස අධිකරණයේ පිස්කල්වරයාට නියම කරන ලෙසත්,

(ඊ) නඩු ගාස්තු ලබා දෙන ලෙසත් දන්වා තීන්දු ප්‍රකාශ කොට ඇත.

එකී තීන්දු ප්‍රකාශය අනුව ගෙවීම් කිරීමට 01 වන විත්තිකරු අපොහොසත් වී පැහැර හැර ඇති බැවින් එකී අධිකරණයෙන් මා වෙත ලැබී ඇති ඇස්කීසි බලපත්‍රයේ බලය පිට මා විසින් තහනමට ගෙන ඇති ඉහත නම් සඳහන් 01 වන විත්තිකරුට අයත් පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති නිශ්චල දේපල, වර්ෂ 2023ක් වූ නොවැම්බර් මස 16 වැනි දින ප. ව. 2.00ට ඉහත නම් සඳහන් 01 වන විත්තිකරුගේ උපලේඛනයේ සඳහන් නිශ්චල දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, වත්තල ප්‍රාදේශීය සභා සීමාවේ සහ වත්තල රාගම් පත්තුවේ, අලුත්කුරු කෝරළේ, හැඳල උපකාර්යාලයේ, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අංක 170-තිඹිරිගස්යාය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, තිඹිරිගස්යාය හැඳල වරිපනම් අංක 57/03සී කසගහ පාර පිහිටි ''හැකවකගහවත්ත'' නැමැති ඉඩම බලයලත් මිනින්දෝරු හියුග් ආර්. සමරසිංහ විසින් මැන සාදන ලද අංක 7548 සහ 2015.11.16 දින දරන පිඹුර ප්‍රකාර ලොට් අංක 01 කැබැල්ලට මායිම් : උතුරට : පිඹුරු අංක 1985 හි ලොට් ඩී සහ බී ද, නැගෙනහිරට : පී. ඩී. නෝබට්ගේ ඉඩම ද, දකුණට : රොහාන් කුරේ සහ ජොසපින් විතානට අයත් ඉඩම ද, බටහිරට : ජොසපින් විතාන හිමිකම් කියන ඉඩම ද, යන මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් දොළහක (පර්. 12) විශාලත්වය ඇති ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ ආදී සියළු දේ ද වේ. (මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ L 311/72 හි ලියාපදිංචි වී ඇත.

*පොදු මාර්ග පරවශතා අයිතිය.-*

1. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, වත්තල ප්‍රාදේශීය සභා සීමාවේ සහ වත්තල රාගම් පත්තුවේ, අලුත්කුරු කෝරළේ, හැඳල උපකාර්යාලයේ තිඹිරිගස්යාය හැඳල පිහිටි ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. ඩබ්ලිව්. ඩී. එස්. ද සිල්වා විසින් මැන සාදන ලද අංක 1985 සහ 1992.11.06 දින දරන පිඹුර ප්‍රකාශ ලොට් අංක ඩී (පාරක් සඳහා වෙන් කරන ලද) කැබැල්ලට මායිම් : උතුරට : පිඹුරු අංක 52 හි ලොට් 02 ද, නැගෙනහිරට : ලොට් ඒ සහ බී ද, දකුණට : ලොට් සී ද, බටහිරට : සෝමසිරි විතානගේ සහ විල්සන් ප්‍රනාන්දුගේ ඉඩම ද, යන මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් තුනයි දශම දෙකයි හයක (පර්. 3.26) ක විශාලත්වය ඇති ඉඩම ආදී සියලු දේ ද වේ. (මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ L 113/125 හි ලියාපදිංචි වී ඇත.)

2. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරලේ, රාගම් පත්තුවේ, වත්තල ප්‍රාදේශීය සභා සීමාවේ සහ වත්තල රාගම් පත්තුවේ, අලුත්කුරු කෝරළේ හැඳල උප කාර්යාලයේ, තිඹිරිගස්යාය හැඳල පිහිටි ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. සමරසේකර විසින් මැන සාදන ලද අංක 52 සහ 1982.07.09 දින දරන පිඹුර ප්‍රකාර ලොට් අංක 02 (පාරක් සඳහා වෙන් කරන ලද) කැබැල්ලට මායිම් : උතුරට : බලයලත් මිනින්දෝරු එම්. පීටර් ප්‍රනාන්දු විසින් 1972.04.02 වැනි දින මැන සාදන ලද පිඹුරු අංක 12 හි ලොට් 12 ද, නැගෙනහිරට : ලොට් 01 ද, දකුණට : ලොට් 04 ද, බටහිරට : පිඹුරු අංක 12හි ලොට් 17ඒ ද, යන මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් තුනක (පර්. 3) විශාලත්වය ඇති ඉඩම ආදී සියලු දේ ද වේ. (මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ 113/126 හි ලියාපදිංචි වී ඇත.)

*ගෙවීමේ ක්‍රමය.-*

වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් ගෙවීම් ගැණුම්කරු විසින් මා වෙත ගෙවිය යුතු ය. සියලුම ගෙවීම් මුදලින් පමණක් කළ යුතු අතර චෙක්පත් භාරගනු නොලැබේ.

01. සම්පූර්ණ ගැනුම් මුදලින් 25% ක් එම ස්ථානයේ දී ම ගෙවිය යුතු ය.
02. ඉතිරි 75% ලිත් මසක් ඇතුළත ඉහත අංක දරන නඩුවට අදාළ ව අධිකරණයේ තැන්පත් කළ යුතු ය.
03. රජයේ හා වෙනත් ගාස්තු ගෙවිය යුතු ය.

රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය,
වැලිසර.

වර්ෂ 2023 ක් වූ ඔක්තෝබර් මස 04 වැනි දින දී ය.

10-250

---

**කොළඹ දිසා අධිකරණයේ දී ය**

පිස්කල් මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

එලායන්ස් ෆිනෑන්ස් කම්පැණි පී.එල්.සී.,
අංක 84, වෝඩ් පෙදෙස, කොළඹ 07.

*නඩු අංකය* : DMB-178-19
*ඇස්කිසි අංකය* : 63/2023
*ස්වභාවය* : උකස්
*වටිනාකම* : රු. 1,182,861.49

*...................පැමිණිලිකරු.*

*එදිරිව*

වැල්හේනගේ විජේනායක,
දිල්කි නිවස,
කොරටුව වත්ත,
පනාමුර.

*..........................විත්තිකරු.*

කොළඹ දිසා අධිකරණයේ ඉහත අංක දරන නඩුවේ 2023.02.22 වැනි දින ඇතුළත් කරන ලද සමථය පරිදි විත්තිකරු විසින් එකී සමථය කඩ කර ඇති බැවින්, සමථ තීන්දු ප්‍රකාශය පරිදි,

(අ) ඉහත විත්තිකරු පැමිණිලිකාර සමාගමට රුපියල් එකොළොස් ලක්ෂ අසූ දෙදහස් අටසිය හැට එකයි ශත හතලිස් නවයක (රු. 1,182,861.49) මුදල හා ඒ මත පොළිය ගෙවීම පැහැර ඇති බවට හා එකී මුදල් ගෙවීමට බැඳී ඇති බවට නඩු තීන්දුවක් ලබාදෙන ලෙසටත්,

(ආ) විත්තිකරු ඉහත රුපියල් එකොළොස් ලක්ෂ අසූ දෙදහස් අටසිය හැට එකයි ශත හතලිස් නවයක (රු. 1,182,861.49) යන මුදල හා නෛතික පොළිය පියවීමේ සුරක්ෂිතයක් ලෙස පැමිණිලිකරු වෙත ලබා දී ඇති ප්‍රසිද්ධ නොතාරිස් එච්. ආර්. ඊ. ගෝතමී හේරත් මහත්මිය විසින් ලියා සහතික කරන ලද අංක 78 දරන උකස්කරය නීතිය ඉදිරියේ ක්‍රියාත්මක කර ගැනීම සඳහා නියෝගයක් ලබා දෙන ලෙසත්,

(ඇ) නඩු ගාස්තු ලබා දෙන ලෙසත්, සමථය පරිදි ගෙවිය යුතු රුපියල් 1,000,000/-මුදලින් කිසිදු මුදලක් ගෙවා නොමැති හෙයින් ඉතිරි මුදල් ලබා ගැනීම සඳහාත් දන්වා තීන්දු ප්‍රකාශ කොට ඇත.

එකී තීන්දු ප්‍රකාශය අනුව ගෙවීම් කිරීමට විත්තිකරු අපොහොසත් වී පැහැර හැර ඇති බැවින් එකී අධිකරණයෙන් මා වෙත ලැබී ඇති ඇස්කිසි බලපත්‍රයේ බලය පිට මා විසින් තහනමට ගෙන ඇති ඉහත නම් සඳහන් විත්තිකරුට අයත් පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති නිශ්චල දේපළ,

**වර්ෂ 2023ක් වූ නොවැම්බර් මස 30 වැනි දින පෙ. ව. 11.00ට** ඉහත නම් සඳහන් විත්තිකරුගේ උපලේඛනයේ සඳහන් නිශ්චල දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**උපලේඛනය**

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කොලොන්න කෝරළේ, දියපොටගම පත්තුවේ, ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ ප්‍රාදේශීය සභා සීමාව තුළ වලල්ගොඩ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ වලල්ගොඩ ග්‍රාමයේ හි පිහිටි ''පළුගහවල හේන්යාය එෆ්.වී.පී. 752 හි 558 කැබැල්ලේ කොටස'' නැමති ඉඩම බලයලත් මිනින්දෝරු එස්. රාමක්‍රිෂ්ණන් විසින් මැන සාදන ලද අංක 3960/12 සහ 2012.02.03 වැනි දින දරන පිඹුර ප්‍රකාර ලොට් A කැබැල්ලට මායිම් : උතුරට : කොලොන්න සිට ඇඹිලිපිටිය දක්වා දිවෙන ප්‍රධාන මාර්ගය ද, නැගෙනහිරට : එච්. ඒ. ප්‍රේමසිරි සහ අමරපාල රූබසිංහ හිමිකම් කියන එම ඉඩමේ ම කොටසක් ද, දකුණට : අමරපාල රූපසිංහ හිමිකම් කියන එම ඉඩමේ ම කොටසක් ද, බටහිරට : අමරපාල රූබසිංහ සහ ඩබ්ලිව්. ජී. ඩේවිඩ් හිමිකම් කියන එම ඉඩමේ ම කොටසක් ද, යන මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් තිස් දෙකයි දශම එකයි බින්දුවක (පර්. 32.10) විශාලත්වය ඇති ඉඩම සහ ඒ තුළ පිහිටි සියලු දේ ද වේ. (මෙය ඇඹිලිපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ L 113/09 හි ලියාපදිංචි වී ඇත.)

*ගෙවීමේ ක්‍රමය.-*

වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් ගෙවීම් ගැණුම්කරු විසින් මා වෙත ගෙවිය යුතු ය. සියලුම ගෙවීම් මුදලින් පමණක් කළ යුතු අතර චෙක්පත් භාරගනු නොලැබේ.

01. සම්පූර්ණ ගැනුම් මුදලින් 25% ක් එම ස්ථානයේ දී ම ගෙවිය යුතු ය.
02. ඉතිරි 75% ලිත් මසක් ඇතුළත ඉහත අංක දරන නඩුවට අදාළව අධිකරණයේ තැන්පත් කළ යුතු ය.
03. රජයේ හා වෙනත් ගාස්තු ගෙවිය යුතු ය.

රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය,
ඇඹිලිපිටිය.

වර්ෂ 2023 ක් වූ ඔක්තෝබර් මස 09 වැනි දින දී ය.

10-251

---

# විවිධ දැන්වීම්

## පාර්ලිමේන්තුව

### කෝදාගොඩ ගුණරතන නාහිමි පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

යදාමිණි ගුණවර්ධන වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ අංක 53 (1) දරන ස්ථාවර නියෝගය යටතේ "කෝදාගොඩ ගුණරතන නාහිමි පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි'', යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණු වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී පදනම සංස්ථාගත කිරීමයි :-

*(අ)* කෝදාගොඩ ගුණරතන පදනම සාමාජිකයන් හා ප්‍රතිලාභීන් අතර ගුණාත්මක සම්බන්ධතාවය වර්ධනය කිරීම ;

*(ආ)* මානව සම්පත් වර්ධනය කිරීම සහ වෘත්තීය දියුණුවට මග සැලසීම ;

*(ඇ)* පදනමේ සාමාජිකයන් හා ප්‍රතිලාභීන්ගේ ආගමික සහ සංස්කෘතික පුනර්ජීවනයක් ඇති කිරීම ;

යනාදිය වේ.

යදාමිණි ගුණවර්ධන,
පාර්ලිමේන්තු මන්ත්‍රී.

10-233

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.